17876

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**44 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2022 (2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2022 (2023)
General Certificate of Education (Ord. Level) Examination, 2022 (2023)

නැටුම් (දේශීය) I, II
நடனம் (சுதேச) I, II
Dancing (Oriental) I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## නැටුම් (දේශීය) I

**විශේෂ උපදෙස් :**

* සියලු ම අයදුම්කරුවන් **I කොටසේ** ප්‍රශ්න **30** ට ම පිළිතුරු සැපයිය යුතු ය. එයට අමතරව **II උඩරට** නර්තනය, **III පහතරට** නර්තනය සහ **IV සබරගමු** නර්තනය යන කොටස් **තුනෙන් එක් කොටසකට පමණක්** පිළිතුරු සැපයිය යුතු ය.
* **II, III** සහ **IV** යන කොටස්වලින් කලවමේ ප්‍රශ්න තෝරා **නොගත යුතු ය.** ඔබ පිළිතුරු සපයන්නේ කුමන කොටසට දැයි පිළිතුරු පත්‍රයේ පැහැදිලිව ලියා දැක්විය යුතු ය.

**සැලකිය යුතුයි:**

(i) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) වරණ අතරින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

### I කොටස

* අංක 1 සිට 10 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන තෝරන්න.

**1.** පංචතූර්ය වාදනය සඳහා ඝන වාද්‍ය භාණ්ඩයක් ලෙස ............................ භාවිත කළ හැකි ය.
(1) කොම්බුව (2) තලිය (3) හොරණෑව (4) බුම්මැඩිය

**2.** ආහාර්ය අභිනය වඩාත් මතුවී පෙනෙන්නේ ............................ නර්තනයේ ය.
(1) වන්නම් (2) සවුදම් (3) තාලම් (4) කෝලම්

**3.** කරුණ රසය ජනිත වන්නේ ...................... භාවය මගිනි.
(1) හාස (2) ශම (3) ශෝක (4) රති

**4.** 'සොබමන් දෙව්වරු සදෙනෙක් එතැනට' මෙම ගායනය ................. කවියකි.
(1) චාමර (2) රබන් (3) කළගෙඩි (4) ලී කෙළි

**5.** මාත්‍රා 2 + 2 + 4, ............................ නමින් හඳුන්වනු ලබයි.
(1) සුළු මැදුම් මහ තුන්තිත (2) දෙමැදුම් මහ තුන්තිත
(3) සුළු දෙමහ තුන්තිත (4) දෙසුළු මහ තුන්තිත

**6.** ග්‍රහපන්ති ගායනා මගින් ග්‍රහයින්ට ආරාධනා කිරීම හා ...................... සෙත් පැතීම සිදු කරයි.
(1) දෙවියන්ට (2) ආතුරයින්ට (3) ග්‍රහයින්ට (4) ශිල්පීන්ට

**7.** කරකලි නර්තනයේදී ................. නමින් හඳුන්වනු ලබන්නේ රැවුල් සඳහා භාවිත කරනු ලබන අංගරචනයයි.
(1) තාඩි (2) මිනික්කු (3) චෙප්පු (4) කත්ති

[දෙවැනි පිටුව බලන්න.

8. රබින්ද්‍රනාත් ටාගෝර්තුමා විසින් ටිගල් නාත්‍ය ශාලාවේ වේදිකාගත කළ ප්‍රථම මුද්‍රා නාට්‍ය .................... ය.
(1) චිත්‍රාංගදා (2) ශාප්මෝචන් (3) සිරිසඟබෝ (4) සැළලිහිණි

9. මණිපුරි නර්තනයේදී ............................ නමින් හඳුන්වන්නේ හිසට පලඳින වේලය යි.
(1) කුමින් (2) ටිකම්පුට්ට (3) කුදොස් (4) මයිකුම්

10. 'තෝඩු දමන්නී පවලම් මාල බඳින්නී - .................... ඔමරි කරන්නී'
(1) අඳක්ගාන්නී නෙත් දෙක
(2) කොක්හඬලන්නී ඇසකින්
(3) සේල අඳින්නී පොටකින්
(4) මල් ගවසන්නී තාලෙට

11. ශාන්තිකර්මයන්හි අටමඟල කවි යොදාගෙන නිර්මාණය වී ඇති ගැමි නැටුමකි.
(1) හටන් (2) චාමර (3) මෝල්ගස් (4) රබන්

12. සොකරි නාටකයේ දක්නට ලැබෙන චරිත වන්නේ,
(1) සොකරි, ආඬිගුරු සහ සොත්තානා ය.
(2) සොත්තානා, පරයා සහ ඩුංගුරුවා ය.
(3) ඩුංගුරුවා, සොකරි සහ ආඬිගුරු ය.
(4) පරයා, පනික්කල සහ වෙදරාළ ය.

13. ආචාර්ය පණිභාරතයන් විසින් නිර්මාණය කරන ලද මුද්‍රා නාට්‍ය දෙකක් වන්නේ,
(1) සැළලිහිණිය සහ පරෙවිය ය.
(2) කුණ්ඩලකේශී සහ ග්‍රහ අපලය ය.
(3) ග්‍රහ අපලය සහ සත්පත්තිනි ය.
(4) චණ්ඩාලිකා සහ සත්පත්තිනි ය.

14. විහාර, පන්සල්වල බුදු ගුණ ගයමින් සිදු කෙරෙන නර්තන විශේෂයකි.
(1) කලඑළි මංගල්‍යය සහ පෙරහර.
(2) සත් සතිය සහ සූවිසි විවරණ.
(3) දිග්ගෙයි නැටුම සහ සූවිසි විවරණ.
(4) කලඑළි මංගල්‍යය සහ සත් සතිය.

15. අංග, ප්‍රත්‍යංග සහ උපාංග පිළිවෙළින් දැක්වෙන වරණය කුමක් ද?
(1) දෑත්, ඇස් සහ තොල්.
(2) කඳ, බෙල්ල සහ හිස.
(3) හිස, බෙල්ල සහ ඇස්.
(4) දෙපා, ඇස් සහ බෙල්ල.

16. 'හනික වරෙව් කොල්ලනේ' නාට්‍ය ගීතයට නර්තන නිර්මාණයේදී වඩාත් උචිත වන්නේ,
(1) තාලානුකූල හා ප්‍රකාශනාත්මක චලන ය.
(2) තාලානුකූල හා රිද්මයානුකූල චලන ය.
(3) රිද්මයානුකූල හා අභිචලන ය.
(4) ස්ථිතික හා සංචාරී චලන ය.

17. මහාවංශයේ සඳහන් ආකාරයට නැටුම් ගැයුම් වැයුම් සහිත ගිරිභණ්ඩ නම් පූජාවක් සිදුකරන ලද රජතුමා වන්නේ,
(1) පණ්ඩුකාභය රජු ය.
(2) භාතික අභය රජු ය.
(3) මහා පරාක්‍රමබාහු රජු ය.
(4) මහා දාඨික මහානාග රජු ය.

18.


A


B


C


ඉහත A, B සහ C රූප මගින් දැක්වෙන හිසෙහි පලඳින රංග වස්ත්‍රාභරණ හඳුන්වන්නේ පිළිවෙළින්,
(1) ශිඛාබන්ධනය, කාංගුල සහ නෙත්ති මාලය ලෙස ය.
(2) ශීර්ෂාභරණ, නෙත්තිමාලය සහ කාංගුල ලෙස ය.
(3) හිසවෙස්, කාංගුල් තොප්පිය සහ කාංගුල ලෙස ය.
(4) හිසවෙස්, වාහල තොප්පිය සහ කාංගුල් තොප්පිය ලෙස ය.

19. හිම කුමාරි හා රන් කිකිළි මුද්‍රා නාට්‍ය නිර්මාණය කරන ලද ශිල්පිනිය වන්නේ,
(1) උපේඛා චිත්‍රසේන ය.
(2) මිරන්ඩා හේමලතා ය.
(3) වජිරා චිත්‍රසේන ය.
(4) චිත්‍රා අල්ගම ය.

17876



20. රූපයෙන් දැක්වෙන නර්තනයෙන් මතුවී පෙනෙන්නේ,



(1) සම්ප්‍රදාය, හැඩතල සහ අභිනය භාවිතයයි.
(2) අවකාශය, සමබරතාව සහ සම්ප්‍රදායයි.
(3) අභිනය, නිර්මාණශීලි බව සහ සම්ප්‍රදායයි.
(4) අවකාශය, තල භාවිතය සහ නිර්මාණශීලි බවයි.

- අංක 21 සිට 25 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු පහත වගුව ඇසුරෙන් තෝරන්න.

| | A | B | C | D |
|---|---|---|---|---|
| 1 | මල පේ කිරීම | බිසෝකප සිටුවීම | හඟල යැදීම | මිල්ල කැපීම |
| 2 | අස්නෙ | යක්ඇනුම | දෙවොල් | යහන් දැක්ම |
| 3 | අඹ විදමන | පත්තිනි | මී බන්ධනය | ආවැන්දුම |
| 4 | ගබඩා කොල්ලය | හත් පද | දුනුමාලප්පුව | කප් සිටුවීම |

21. ශාන්තිකර්මවල නාට්‍යමය පෙළපාලි දෙකක් වන්නේ,
(1) 1 පේළියේ B හා D ය.
(2) 2 පේළියේ A හා B ය.
(3) 3 පේළියේ A හා C ය.
(4) 4 පේළියේ B හා D ය.

22. ගායනය රහිත නර්තන අංග දෙකක් වන්නේ,
(1) 1 පේළියේ B හා C ය.
(2) 2 පේළියේ B හා D ය.
(3) 3 පේළියේ B හා D ය.
(4) 4 පේළියේ A හා C ය.

23. ගායනය සහිත නර්තන අංග දෙකක් වන්නේ,
(1) 1 පේළියේ C හා D ය.
(2) 2 පේළියේ A හා C ය.
(3) 3 පේළියේ A හා D ය.
(4) 4 පේළියේ B හා C ය.

24. උඩරට, පහතරට සහ සබරගමු යන ශාන්තිකර්ම තුනෙහිම පොදුවේ දැකිය හැකි අංග වනුයේ,
(1) 1 පේළියේ A හා C ය.
(2) 2 පේළියේ C හා D ය.
(3) 3 පේළියේ B හා D ය.
(4) 4 පේළියේ B හා D ය.

25. පහන් මඩුව සහ දෙවොල් මඩුව ශාන්තිකර්ම දෙකට පමණක් සුවිශේෂ චාරිත්‍ර දෙකක් වනුයේ,
(1) 1 පේළියේ B හා D ය.
(2) 2 පේළියේ B හා D ය.
(3) 3 පේළියේ A හා D ය.
(4) 4 පේළියේ C හා D ය.

26. නාට්‍ය ශාස්ත්‍රය හා අභිනය දර්පණ ග්‍රන්ථ රචනාකර ඇත්තේ පිළිවෙළින්,
(1) නන්දිකේශ්වර හා භරතමුනි ය.
(2) භරතමුනි හා නන්දිකේශ්වර ය.
(3) භරතමුනි හා චන්ද්‍රගුප්ත ය.
(4) නන්දිකේශ්වර හා චන්ද්‍රගුප්ත ය.

27. ආහාර්ය අභිනයේ ප්‍රධාන කොටස් දෙකක් වන්නේ,
(1) අංග රචනය සහ වෙස් මෝස්තර රචනය යි.
(2) අංග රචනය සහ රංග රචනය යි.
(3) රංග රචනය සහ වේශ නිරූපණය යි.
(4) වෙස් මෝස්තර රචනය සහ රංග රචනය යි.

28. දක්ෂිණ භාරතයේ චක්කියර් කුත්තු සහ කුඩි ආට්ටම් ගැමි නැටුම් ඉදිරිපත් කරන ලද්දේ,
(1) පොන්නානි හා සිංකිඩි විසිනි.
(2) කැලිකට්හි සැමොරින් රජු විසිනි.
(3) වල්ලතෝල් නාරායන මෙනන් විසිනි.
(4) කේරළයේ චක්කියර්වරු විසිනි.

29. කරදිය මුද්‍රා නාට්‍යයේ 'චන්ද'ගේ චරිතය නිරූපණය කළ ශිල්පියා වූයේ,
(1) චිත්‍රසේන ඩයස් ය.
(2) කේ. එන්. එස්. අටුගොඩ ය.
(3) සේන වලවේ ය.
(4) මහින්ද ඩයස් ය.

30. කෝලම් නාටකයේ රංග කාර්යයේදී දැකිය හැක්කේ,
(1) හොරණෑව, වෙස්අත්ත සහ මොණරපිල ය.
(2) වෙස්අත්ත, පහන්පැල සහ හොරණෑව ය.
(3) මල්පැල, වෙස්අත්ත සහ වංගෙඩිය ය.
(4) වෙස්අත්ත, මොණරපිල සහ ලන්තෑරුම ය.

[හතරවැනි පිටුව බලන්න.

17876



## II කොටස - උඩරට නර්තනය

31. තුන් තිතේ තාල රූපයකට වාදනය කළ හැකි උඩරට නර්තන සම්ප්‍රදායේ බෙර පදය තෝරන්න.
(1) ජිං කුඳ ජිමිත ගත් තත් තකට
(2) දොං තකු දොං තකු දොංජිං ගත් තත් ජිං තරිකිට
(3) දොං තකු දොං ජිං තක තරිකිට
(4) ගොග් ගොග් ජිං ජිංගත

32. ගැට බෙරයෙහි ගැට්වැල සහ බෙර කඳ සඳහා සුදුසු දැව වර්ග වන්නේ පිළිවෙළින්,
(1) පේර සහ ඇහැළ ය.
(2) වේවැල් සහ පොල් ය.
(3) කිරිඳිවැල් සහ කිතුල් ය.
(4) කිරිඳිවැල් සහ රත් ඇහැළ ය.

33. මඩුපුරයේ සහ ඌරා යක්කමේ භාවිත කෙරෙන රංග භාණ්ඩ ඇතුළත් වරණය තෝරන්න.
(1) පොල් මල සහ දුන්න
(2) පන්දම සහ දුන්න
(3) අත්පන්දම සහ ඊතලය
(4) පොල් මල සහ පුවක් මල

34. දොළොස්වන ගොඩ සරඹයේ කස්තිරම පිළිබඳ නිවැරදිම ප්‍රකාශය කුමක් ද?
(1) දීර්ඝතම කස්තිරමයි. කැරකිම් ක්‍රමයක් ප්‍රගුණ කෙරේ.
(2) දීර්ඝතම කස්තිරමයි. පැනීම් ක්‍රමයක් ප්‍රගුණ කෙරේ.
(3) බීජාක්ෂර අනුව මුද්‍රා වේ. සුරල් පැගීම ප්‍රගුණ කෙරේ.
(4) බීජාක්ෂර අනුව මුද්‍රා වේ. දෑත පැගීම ප්‍රගුණ කෙරේ.

35. උඩරට නර්තන සම්ප්‍රදායට ආවේණික පාරිභාෂික වචන තුනකි.
(1) පා සරඹ, ගොඩ සරඹ සහ කස්තිරම
(2) කස්තිරම, සිරුමාරුව සහ යක් ඇනුම
(3) කස්තිරම, සිරුමාරුව සහ අඩව්ව
(4) මණ්ඩිය, වන්නම් සහ ආවැන්දුම

36. මෙම අඩව්ව සම්පූර්ණ කිරීමට සුදුසු පද කොටස් පිළිවෙළින් ඇතුළත් වරණය තෝරන්න.
'කුඳග .......... තකට කුංදත් තග්ග ........ තකට කුංදත්'
(1) ජිත්තක, ජිත්තක
(2) ජිංතක, රුජිගත
(3) ජිකුදඩ, දොහොකඩ
(4) ජිත්තක, ජිකුදඩ

37. 'ඉන්ද්‍ර දිසාවට ඉඹුල් විමානෙට ........' යන ග්‍රහ පන්තිය ගායනයේදී භාවිත කළ හැකි තාල රූපයට අයත් උඩරට වන්නමක් වන්නේ,
(1) සැවුලා ය.
(2) තුරඟා ය.
(3) වෛරෝඩි ය.
(4) සිංහරාජ ය.

38. කොහොඹා කංකාරියේ සැරසිලි හා සම්බන්ධ වේ.
(1) යක්ගෙය, යහන සහ මල්මඩුව.
(2) අයිලය, තොරණ සහ දෙවොල් ගෙය.
(3) අයිලය, පස්වලු සහ යහන.
(4) යහන, මඩුව සහ කාලපන්දම් ගස.

39. ගැටබෙරය වාදනය කළ හැකි නර්තනයක්, ගැමි නාට්‍යයක් සහ ශාන්තිකර්මයක් පිළිවෙළින් ඇතුළත් වරණය කුමක් ද?
(1) මුල් මාත්‍රය, සොකරි සහ කඩවර කංකාරිය.
(2) දුනුමාලේප්පුව, සොකරි සහ කොහොඹා කංකාරිය.
(3) ආවැන්දුම, කෝලම් සහ කොහොඹා කංකාරිය.
(4) යක් ඇනුම, නාඩගම් සහ වලියක් මංගල්‍යය.

40. උඩරට නර්තන සම්ප්‍රදාය හදාරන ආධුනිකයෙකු ප්‍රථමවරට චාරිත්‍රානුකූලව රංග කුසලතා එළිදක්වන්නේ,
(1) ගුරු වරම්දීමේදී ය.
(2) මඩු බැසීමේදී ය.
(3) කලඑළි මංගල්‍යයේදී ය.
(4) සාම්ප්‍රදායික රඟමඩලකදී ය.

[පස්වැනි පිටුව බලන්න.

## III කොටස - පහතරට නර්තනය

**31.** තුන් තිතේ තාල රූපයකට වාදනය කළ හැකි පහතරට නර්තන සම්ප්‍රදායේ බෙර පදය තෝරන්න.
(1) තකදිත් තකදොම් දොම් දොම් තක
(2) දිත්තම් දිතකු දොම් දොම් තාම්
(3) ගුම් දෙගත ගත්ත ගුඳ
(4) දිත්තම් දිතකු ගත්තත් ජිං තරිකිට

**32.** පහතරට බෙරයෙහි ගැටිවැල සහ බෙර කඳ සඳහා සුදුසු දැව වර්ග වන්නේ පිළිවෙළින්,
(1) කිරිඳිවැල් සහ පුළුන් ය.
(2) රත්මල් සහ කොහොඹ ය.
(3) වේවැල් සහ කිරිඳිවැල් ය.
(4) වේවැල් සහ කිතුල් ය.

**33.** තෙල්මේ සහ දොළහ පෙළපාළියේදී භාවිත කෙරෙන රංග භාණ්ඩ ඇතුළත් වරණය තෝරන්න.
(1) විලක්කුව සහ කුඩය
(2) පොල් මල සහ දළුමුර
(3) පන්දම සහ පොල් මල
(4) ඊතලය සහ කොඩිය

**34.** දහවන ඉලංගම් සරඹයේ ඉරට්ටිය පිළිබඳ නිවැරදිම ප්‍රකාශය කුමක් ද?
(1) මණ්ඩියෙහි නර්තනය කිරීම පුහුණු කළ හැකිය.
(2) බීජාක්ෂර නර්තනය කිරීම පුහුණු කළ හැකිය.
(3) වමට සහ දකුණට සුරල් පෑගීම පුහුණු කළ හැකිය.
(4) වමට සහ දකුණට පැනීම් ක්‍රමය පුහුණු කළ හැකිය.

**35.** පහතරට නර්තන සම්ප්‍රදායට ආවේණික පාරිභාෂික වචන තුනකි.
(1) අන්තාඩිය, ඉරට්ටිය සහ දොඹින පද.
(2) ඉරට්ටිය, ඉලංගම් සරඹ සහ බඹර වළල්ල.
(3) කලාසම, ඉරට්ටිය සහ සින්දු වන්නම්.
(4) අන්තාඩිය, සින්දු වන්නම් සහ සීරුමාරුව.

**36.** මෙම ඉරට්ටිය සම්පූර්ණ කිරීමට සුදුසු පද කොටස් පිළිවෙළින් ඇතුළත් වරණය තෝරන්න.
'තත් ........... දිත් දිත් තෙයි, ගත ...... දිත් දිත් තෙයි'
(1) ගුඳගත, ගුඳගත
(2) දොංගත, දොංගත
(3) දොංගත, රුදගත
(4) ජිංගත, ගුඳගත

**37.** 'ඉන්ද්‍ර දිසාවට ඉඹුල් විමානෙට ......' යන ග්‍රහපන්ති ගායනයේදී භාවිත කළ හැකි තාල රූපයට අයත් පහතරට සිංදු වන්නමක් වන්නේ,
(1) ශුද්ධ තාලය ය.
(2) නාතිලිංචි තාලය ය.
(3) ඊශ්වරකුණ්ඩ තාලය ය.
(4) අනුරාගදණ්ඩ තාලය ය.

**38.** දෙවොල් මඩුවේ සැරසිලි කිහිපයක් වන්නේ,
(1) දෙවොල් ගෙය, දෙවොල් තොරණ සහ යක්ගෙය ය.
(2) පත්තිනි තොරණ, කාලපන්දම් ගස සහ ගොඩඅයිලය ය.
(3) පත්තිනි තොරණ, කාලපන්දම් ගස සහ දෙවොල් තොරණ ය.
(4) දෙවොල් තොරණ, මල් යහන් සහ ගොඩඅයිලය ය.

**39.** පහතරට බෙරය වාදනය කළ හැකි නර්තනයක්, ගැමි නාට්‍යයක් සහ ශාන්තිකර්මයක් පිළිවෙළින් ඇතුළත් වරණය කුමක් ද?
(1) පත්තිනි, කෝලම් සහ පහන් මඩුව
(2) දෙවොල්, කෝලම් සහ දෙවොල් මඩුව
(3) යහන්දැක්ම, සොකරි සහ සන්නියකුම
(4) ගිරිදේවි, නාඩගම් සහ දෙවොල් මඩුව

**40.** පහතරට නර්තන සම්ප්‍රදාය හදාරන ආධුනිකයෙකු ප්‍රථමවරට චාරිත්‍රානුකූලව රංග කුසලතා එළිදක්වන්නේ,
(1) ගුරු වරම් දීමේදී ය.
(2) කලඑළි මඩුවේදී ය.
(3) මඩු බැසීමේදී ය.
(4) සාම්ප්‍රදායික රඟමඩලකදී ය.

[හයවැනි පිටුව බලන්න.

## IV කොටස - සබරගමු නර්තනය

**31.** තුන් තිතේ තාලරූපයකට වාදනය කළ හැකි සබරගමු නර්තන සම්ප්‍රදායේ බෙර පදය තෝරන්න.
(1) දොම්තකු දොම්තකු දොම්ජිං ගත් තත් ජිං තරිකිට
(2) ජිං කුඳ ජිමිත ගත් තත් තකට
(3) ජිං කුඳ ජිමිත ගජ්ජිං කුංතක ජිං තරිකිට
(4) ජිංත ජිමිත්තන් තක්කිට තරිකිට

**32.** සබරගමු දවුලේ කඩිප්පුව සහ බෙර කඳ සඳහා සුදුසු දැව වර්ග වන්නේ පිළිවෙළින්,
(1) කිරිඳිවැල් සහ පොල් ය.
(2) වේවැල් සහ කිතුල් ය.
(3) පේර සහ මහෝගනී ය.
(4) රත් මල් සහ ඇහැළ ය.

**33.** දෙවොල් නැටුම සහ මල් මඩු පුරයේදී භාවිත කෙරෙන රංග භාණ්ඩ ඇතුළත් වරණය තෝරන්න.
(1) පන්දම සහ පොල් මල
(2) දුන්න සහ පොල් මල
(3) අත් පන්දම සහ පුවක් මල
(4) පන්දම සහ චාමර

**34.** දොළොස්වන දොඹින පදය පිළිබඳ නිවැරදිම ප්‍රකාශය කුමක් ද?
(1) කැරකීම් ක්‍රමයක් පුහුණු කළ හැකිය.
(2) පැනීම් ක්‍රමයක් පුහුණු කළ හැකිය.
(3) සුරල් නර්තනය පුහුණු කළ හැකිය.
(4) තාණ්ඩව නර්තනය පුහුණු කළ හැකිය.

**35.** සබරගමු නර්තන සම්ප්‍රදායට ආවේණික පාරිභාෂික වචන තුනකි.
(1) කලාසම, අඩව්ව සහ මුදුන් තාලය.
(2) කලාසම, පට්ටුතල් මාත්‍රය සහ දොඹින පද.
(3) මුගුරු පද, කොලොන්න පද සහ දෙතාලය.
(4) මුගුරු පද, ඉලංගම් සරඹ සහ මුදුන් තාලය.

**36.** මෙම අඩව්ව සම්පූර්ණ කිරීමට සුදුසු පද කොටස් පිළිවෙළින් ඇතුළත් වරණය තෝරන්න.
'තාත් .......... තකට තත්ජිත් කිනම් .......... ගත කුඳා'
(1) තත් ජිත්, තත් ජිත්
(2) තත් ජිත්, තොං නං
(3) තොං නං, තොං නං
(4) තොං නං, තත් ජිත්

**37.** 'ඉන්ද්‍ර දිසාවට ඉඹුල් විමානෙට ......' යන ග්‍රහපන්ති ගායනයේදී භාවිත කළ හැකි තාල රූපයට අයත් සබරගමු වන්නමක් වන්නේ,
(1) කොවුලා ය.
(2) කුදිරඩි ය.
(3) මණ්ඩූක ය.
(4) විරාඩි ය.

**38.** පහන් මඩුවේ සැරසිලි කිහිපයක් වන්නේ,
(1) දෙවොල් තොරණ, අයිලය සහ යහන ය.
(2) තොරණ, කාලපන්දම්ගස සහ යක්ගෙය ය.
(3) තොරණ, කාලපන්දම්ගස සහ මල් යහන ය.
(4) මල් යහන, අයිලය සහ යක්ගෙය ය.

**39.** සබරගමු දවුල වාදනය කළ හැකි නර්තනයක්, ගැමි නාට්‍යයක් සහ ශාන්තිකර්මයක් පිළිවෙළින් ඇතුළත් වරණය කුමක් ද?
(1) ගමන් මාත්‍රය, නාඩගම් සහ සන්නි යකුම
(2) යහන් දැක්ම, සොකරි සහ පහන් මඩුව
(3) පත්තිනි, සොකරි සහ සන්නි යකුම
(4) හිරිදේවි, කෝලම් සහ පහන් මඩුව

**40.** සබරගමු නර්තන සම්ප්‍රදාය හදාරන ආධුනිකයෙකු ප්‍රථමවරට චාරිත්‍රානුකූලව රංග කුසලතා එළි දක්වන්නේ,
(1) මඩු බැසීමේදී ය.
(2) කලඑළි මඩුවේදී ය.
(3) ගුරු වරම්දීමේදී ය.
(4) සාම්ප්‍රදායික රඟමඩලකදී ය.

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

44 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2022(2023)
General Certificate of Education (Ord. Level) Examination, 2022(2023)

නැටුම් (දේශීය) I, II
நடனம் (சுதேச) I, II
Dancing (Oriental) I, II

## නැටුම් (දේශීය) II

* **පළමුවැනි** ප්‍රශ්නය අනිවාර්ය වේ.
* **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම ලකුණු **12** බැගින් හිමි වේ.

**1.** **සියලු ම** ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු ඔබගේ පිළිතුරු පත්‍රයේ **අදාළ ප්‍රශ්න අංකය යොදා ඉදිරියෙන් ලියන්න.**

(i) මුදලි චරිතය රංගනය කරනු ලබන්නේ ................................ නාටකයේ දී ය.

(ii) කුම්භ කතාව .................................................... විසින් රංග රචනය කරන ලද්දකි.

(iii) ක්‍රි. ව. 1934 දී හොරණ ශ්‍රීපාලි ආයතනයට මුල්ගල තබන ලද්දේ .................................. විසිනි.

(iv) කාන්තාවන් 500 ක් පමණ දේවාල නර්තනයෙහි යෙදුණු බව ............................. ගේ වාර්තාවෙන් හෙළි වේ.

(v) පොලොන්නරු යුගයේ දී හමුදා සෙබළුන්ගේ ආස්වාදය පිණිස නැටුම්, ගැයුම්, වැයුම් පැවැත් වූ බව ............................... හි සඳහන් වේ.

(vi) මනිපුරි නර්තනයට යොදාගන්නා ප්‍රධාන තත් භාණ්ඩය ................................ නමින් හඳුන්වයි.

(vii) පත්තිනි දේවිය අනුරූපණය කරමින් සුවිශේෂ රංග කාර්යක් දැකිය හැක්කේ ................................ සම්ප්‍රදායේ ශාන්තිකර්මවලදී ය.

(viii) බෞද්ධාගමික කටයුත්තකදී සන්නිවේදන කාර්ය සිදු කරනු ලබන්නේ ................................ වාදනයෙනි.

(ix) දේශීය මුද්‍රා නාට්‍ය නර්තන නිර්මාණකරණයට සහ නර්තන අධ්‍යාපන ගමන්මගට දායක වූ ප්‍රවීණ කාන්තාවන් දෙදෙනෙක් නම් කරන්න.

(අ) දේශීය මුද්‍රා නාට්‍ය කලාව - ..........................................

(ආ) නර්තන අධ්‍යාපන ගමන්මග - ..........................................

(x) පහත දැක්වෙන ගීත ඇතුළත් වන්නේ කුමන නාට්‍යයන්හි ද?

(අ) වාසනා දිනේකි - ..........................................

(ආ) මෙම ගිම්හාන - ..........................................

**2.** (i) තුන්තිතේ ප්‍රභේදයකට අදාළව බෙර පදයක් ප්‍රස්තාර කරන්න.

(ii) 'නම් උතුම් පෙම්බර ගුණ රුසිරු රමානා' යන කවි පදය අදාළ තිත් රූපයට ප්‍රස්තාර කරන්න.

(iii) සිංහරාජ වන්නමේ **කස්තිරම** හෝ අනුරාගදණ්ඩ තාලයේ **ඉරට්ටිය** හෝ විරාඩි වන්නමේ **කලාසම** හෝ ප්‍රස්තාර කරන්න.

**3.** පහත සඳහන් මාතෘකා අතුරෙන් **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.

(i) මෝල්ගස් නැටුම

(ii) රසභාව

(iii) වාචික අභිනය

(iv) සින්දු වන්නම්

(v) රණ බෙර

[අනෙක් පිටුව බලන්න.

(4.) දේශීය ශාන්තිකර්ම පද්ධතියෙහි පුරාවෘත්ත හා චත්පිළිවෙත්හි එකිනෙකට වෙනස් වූ ආකෘතික ලක්ෂණ දැකිය හැකිය.

(i) ශාන්තිකර්ම පැවැත්වීමේ අරමුණු දෙකක් අතීතය හා වර්තමානය ඇසුරෙන් විස්තර කරන්න.

(ii) දෙවොල් මඩුවේ සහ පහන් මඩුවේ සැරසිලිවල සමානතා සාකච්ඡා කරන්න.

(iii) කොහොඹා කංකාරිය පුරාවෘත්තය හා බැඳි කතා පුවතින් සන්නිවේදනය කරන්නා වූ ආගමික පසුබිම සහ සමාජ ආකල්ප විමසුමට ලක් කරන්න.

(5.) නර්තන කලාවේ සංවර්ධනයට අධ්‍යාපනික, සමාජීය හා සංස්කෘතික ලක්ෂණ බෙහෙවින් බලපා ඇති බව අනාවරණය කරගත හැකිය.

(i) නර්තන කලාවේ ප්‍රවර්ධනය උදෙසා නැටුම් කණ්ඩායම් බිහිවීම පිළිබඳ කරුණු **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න.

(ii) දේශීය නර්තන කලාව ව්‍යවහාරික නර්තනයක් ලෙස සමාජගතවීමේ දී සංස්කෘතික වශයෙන් වෙනස්කම් සිදු වී ඇත. සාකච්ඡා කරන්න.

(iii) සමාජ මාධ්‍ය මගින් ප්‍රචාරණය කෙරෙන නර්තනාංග මගින් දැනුම හා රසඥතාව වර්ධනය වේ ද? ඔබේ අදහස් දක්වන්න.

(6.) පහත දැක්වෙන රූප ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A




C



B



D



(i) A හා B රූපවල දැක්වෙන්නේ කුමන නර්තන සම්ප්‍රදායන් ද? ඒවායෙහි ප්‍රධාන අවනද්ධ වාද්‍ය භාණ්ඩ **එක** බැගින් නම් කරන්න.

(ii) C රූපය මගින් දැක්වෙන නාටකය නම් කර එහි එක් චරිතයක් හඳුන්වන කවියක් උදාහරණයට ගෙන විස්තර කරන්න.

(iii) D රූපයෙන් දැක්වෙන කතා තේමාවෙන් සමාජයට ලබාදෙන පණිවිඩය විමසුමට ලක් කරන්න.

7. (i) නිර්මාණ නර්තනයක් සඳහා යොදාගත හැකි කාන්තා හෝ පුරුෂ හෝ රංග වස්ත්‍රාභරණ කොටස් **දෙකක්** නම් කර ඒවා චිත්‍රණය කරන්න.

(ii) ශාන්තිකර්මයක නාට්‍යමය අවස්ථාවක් තෝරා ගෙන එහි සතර අභිනයෙහි උපයෝගීතාව විස්තර කරන්න.

(iii) නර්තන කලාව හැදෑරීම සමාජීය වටිනාකම් ගොඩනගා ගැනීමට ඉවහල් වේ. පහත දැක්වෙන කරුණු ඇසුරෙන් විමසන්න.

(අ) ශාන්තිකර්ම පද්ධතියෙහි

(ආ) පාසල් පංති කාමරයෙහි

* * *